**ශ්‍රී ලංකා ආධුනික බේස් පන්දු/ සැහැල්ලු පන්දු සම්මේලනය - 2019**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය වියාචනය

ශ්‍රී ලංකා ආධුනික බේස් පන්දු/ සැහැල්ලු පන්දු සම්මේලනයේ ("සම්මේලනය") 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් විසින් මට සහාය වන ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් සංගමයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි සපයා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2. මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

------------------------------------------------------

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා දේපල, පිරියත හා උපකරණ ක්ෂයවීම් රු. 55,562 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ක්ෂයවීම් නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ආ) | ජපන් සංගමයක් විසින් පරිත්‍යාග කරන ලද පාසල් හා විශ්වවිද්‍යාල අතර බෙදාහරින ලද ක්‍රීඩා උපකරණවල නිශ්කාෂණ ගාස්තු වැරදීමකින් සංගමයේ දේපල, පරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. එබැවින් ජංගම නොවන වත්කම් හා හිමය රු. 1,669,589 ක් වූ එම අගයෙන්ම වැඩිපුර දක්වා තිබුණි. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම්වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

-----------------------------------------

| | අයිතමය | වටිනාකම<br>රු. | සාක්ෂි නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | --------------- | -------------- | ----------- | ------------- | ------------- |
| (අ) | ගෙවිය යුතු ක්‍රීඩා පිටි ගාස්තු | 1,097,100 | ශේෂ සනාථ කිරීම, ණය ගිවිසුම | සංගමයේඅදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගෙවිය යුතු ණය | 5,838,300 | ශේෂ සනාථ කිරීම, ගිවිසුම | සංගමයේඅදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. සමාලෝචනය

-----------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,098,697 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 53,957 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,152,654 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු ආදායම රු. 28,912,741 කින් වැඩිවීම හා මුළු වියදම් රු. 36,065,395 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා හේතු වී තිබුණි.